සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. සෞරග්‍රහ මණ්ඩලයේ පිහිටි මතුපිට උෂ්ණත්වය අධිකම ග්‍රහලෝකය මින් කුමක්ද?
   i. බුධ ii. අඟහරු iii. සිකුරු iv. සෙනසුරු
2. සෞරග්‍රහ මණ්ඩලයට අයත් එහෙත් ග්‍රහලෝකවලට අයත් නොවන අභ්‍යාවකාශ වස්තුව කුමක්ද?
   i. පෘථිවිය ii. ප්ලුටෝ iii. නෙප්චූන් iv. යුරේනස්
3. පහත දැක්වෙන රටවල් අතුරින් සම්මත වේලා කලාප කිහිපයක් ඇතුළත් වන රට කුමක්දැයි තෝරන්න.
   i. භූතානය ii. නේපාලය iii. මැඩගස්කරය iv. කැනඩාව
4. අඟහරු ග්‍රහලෝකය පිළිබඳ සත්‍ය ප්‍රකාශය තෝරන්න.
   i. ග්‍රාහක හා උල්කාපාත කඩා වැටීමේ අවධානම වැඩිය.
   ii. අභ්‍යාවකාශයේ දීප්තිමත්ව දර්ශනය වේ.
   iii. අභ්‍යාවකාශයේ රතු පැහැයෙන් දිස්වන නිසා රතු ග්‍රහයා නමින්ද හඳුන්වයි.
   iv. සෞරග්‍රහ මණ්ඩලයේ දෙවන විශාලතම ග්‍රහලෝකය වේ.
5. දකුණු ආසියානු කලාපයේ පවතින්නේ,
   i. සෞම්‍ය දේශගුණයකි. ii. ශීත දේශගුණයකි.
   iii. නිවර්තන දේශගුණයකි. iv. උණුසුම් කාලගුණයකි.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදිනම් (✓) ලකුණ ද, වැරදිනම් වැරදි (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

6. සූර්යයාගේ අභ්‍යන්තරයේ සිදුවන විවිධ ප්‍රතික්‍රියා නිසා අධික තාපයක් නිකුත් වෙයි. ( )
7. සෙරිස්, සූර්යයා හා ග්‍රාහක වළල්ල අතර පිහිටි වාමන ග්‍රහලෝකයකි. ( )
8. පෘථිවි ගෝලයේ සමක විෂ්කම්භයට වඩා ධ්‍රැවක විෂ්කම්භය වැඩිය. ( )
9. මුළු පෘථිවි තලයෙන් 29% ක් ම ගොඩබිම් ප්‍රදේශ වේ. ( )
10. දෙසැම්බර් 22 සූර්යයා කර්කටක නිවර්තනයට මුදුන්වීම සිදු වේ. ( )

- **අංක 11සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

11. ආලෝකය හා තාපය නිකුත් කරන ශක්ති ප්‍රභවයක් සහිත අභ්‍යාවකාශ වස්තූන් .............................. ලෙස හැඳින්වේ. (සූර්යයා/ තාරකා/ ග්‍රහලෝක)
12. සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධාන ග්‍රහලෝක වලට අයත් උපග්‍රහයන් ගණන .......................... පමණ වේ. (173/ 67/ 8)
13. සෞරග්‍රහ මණ්ඩලයේ දෙවන විශාලතම ග්‍රහලෝකය .............................. වේ. (බ්‍රහස්පති/ පෘථිවිය/ සෙනසුරු)

14. කොරල් හා අතොළු වලින් සැදී දකුණු ආසියාවට අයත් දූපත් රාජ්‍ය ........................................ වේ.
(නිකොබාර්/ මාලදිවයින/ ලක්ෂතීව්)

15. දකුණු ආසියානු කලාපයේ පිහිටි .............................. හි කඳුකර භූ දර්ශනය බහුලව දැකගත හැකි රටකි.
(පාකිස්ථානය/ බංගලාදේශය/ නේපාලය)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදන්න.**

16. විශ්වය නිරීක්ෂණය සඳහා ක්‍රි. ව. 1610 දී දුර දක්නය මුල්වරට භාවිත කරන ලද්දේ, .................................... විසිනි.

17. 'Planet 9' නමින් පෘථිවිය මෙන් නව ගුණයක් පමණ විශාල ග්‍රහලෝකයක් ඇතැයි අනාවරණය කළේ ඇමරිකා එක්සත් ජනපදයේ ........................................ ආයතනය විසිනි.


18. ජලය ගොඩබිම හා වායුගෝලය අතර චක්‍රීයව සංසරණය වීම ................................... ලෙස හැඳින්වේ.

19. දකුණු ආසියානු කලාපය සමකයේ සිට දළ වශයෙන් උතුරු අක්ෂාංශ ......................... දක්වා විහිදේ.

20. පාථිවියේ .............................. ශක්තිය මගින් වායුගෝලය පෘථිවි තලය හා බැඳී පවතී.

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**




(1)

අ) i. A රටෙහි පිහිටි දිගම ගංගාව ලියන්න. (ල. 1)

ii. B රටෙහි පිහිටි වගුරුබිමක් ලියන්න. (ල. 1)

iii. C රටෙහි අගනුවර කුමක්ද? (ල. 1)

iv. D අක්ෂරයෙන් දක්වා ඇත්තේ සමුද්‍ර සන්ධියකි. එහි නම ලියන්න. (ල. 1)

v. ඉහත රටවල් අතරින් ජනගහනය අධිකම රටෙහි නම ලියන්න. (ල. 1)


vi. දකුණු ආසියාවේ කාන්තාර භූ දර්ශනය දැකගත හැකි ප්‍රදේශයක් නම් කරන්න. (ල. 1)

vii. E හා F අක්ෂරවලින් දැක්වෙන දූපත් දෙක පිළිවෙලින් නම් කරන්න. (ල. 2)

ආ) පහත A, B, C හා D අක්ෂරවලින් දැක්වෙන රූප සටහන් හඳුනාගෙන නම් කරන්න. (ල. 4)


A


B


C


D

ඉ) සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක හා සම්බන්ධ වන පහත සඳහන් තොරතුරුවලට අදාළ වන නිවැරදි පිළිතුර සපයන්න.

a) විශාලතම ග්‍රහලෝකය

b) අධික ශීතලිකින් යුක්ත ග්‍රහලෝකය

c) නැගෙනහිර සිට බටහිර දෙසට භ්‍රමණය වන ග්‍රහලෝකය

d) එක් උපග්‍රහලෝකයක් ඇති ග්‍රහලෝකය

(2)

i. අභ්‍යන්තර ග්‍රහලෝක ලෙස හඳුන්වන්නේ මොනවාද? (ල. 2)

ii. a) අභ්‍යන්තර ග්‍රහලෝක අතර විශාලතම ග්‍රහලෝකය නම් කරන්න.

b) අභ්‍යන්තර ග්‍රහලෝකවල විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 3)

iii. a) සෙරිස් හැර සෞරග්‍රහ මණ්ඩලයට අයත් වාමන ග්‍රහලෝක 4 ක් ලියන්න. (ල. 6)

b) වාමන ග්‍රහලෝකවල විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

(3)

i. දේශාංශ යනු මොනවාද? (ල. 2)


ii. a) දේශාංශ $0^0$ රේඛාව හඳුන්වන නම ලියන්න.

b) දේශාංශ $0^0$ හි වේලාව පෙ. ව 10.30 සේ සලකා පහත සඳහන් දේශාංශයන්හි වේලාව ගණනය කරන්න.

1. නැගෙනහිර දේශාංශ $80^0$

2. බටහිර දේශාංශ $45^0$ (ල. 5)

iii. පහත රූප සටහනේ A,B,C හා D අක්ෂරවලින් දක්වා ඇති අක්ෂාංශ රේඛා නම් කරන්න. (ල. 4)





(4)

i. පෘථිවි පරිභ්‍රමණය යනු කුමක්ද? ඒ සඳහා ගත වන කාලය කොපමණද? (ල. 3)

ii. පෘථිවි පරිභ්‍රමණය නිසා ඇතිවන ප්‍රතිඵල දෙකක් ලියන්න. (ල. 2)

iii. a) පහත A හා B රූප සටහන් වලින් දැක්වෙන සෘතු දෙක අනුපිළිවෙලින් ලියන්න. (ල. 2)



A



B

b) ඉහත B රූපයේ දැක්වෙන සෘතුවේ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 4)

(5)

i. පෘථිවි වායුගෝලයේ සංයුතිය පහත දැක්වේ. එහි A, B, C හා D වලට අදාළ නිවැරදි පිළිතුර අනුපිළිවෙලින් ලියන්න. (ල. 4)

| වායු වර්ගය | පරිමාව ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|
| නයිට්‍රජන් | A. ........................................... |
| B. ............................ | 20.95 |
| ආගන් | C. ........................................... |
| D. ............................ | 0.03 |
| ඕසෝන් | 0.00006 |

ii. වායුගෝලයෙන් ඇති ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 3)

iii. වායුගෝලය දූෂණය වීමට හේතුවන මානව ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල. 4)

(6)

i. පහත රූප සටහනේ A, B, හා C ලෙස දැක්වෙන්නේ පෘථිවියේ ජලය පවතින ආකාර වේ. ඒවා පිළිවෙලින් නම් කරන්න. (ල. 3)


A


B


C

ii. පෘථිවියේ මතුපිට ජලය මිනිසාට වැදගත්වන ආකාර තුනක් ලියන්න. (ල. 3)


iii. a) ජලය දූෂණය වීමට හේතුවන මානව ක්‍රියාකාරකම් තුනක් ලියන්න.

b) ජලගෝලය දූෂණය වීමෙන් මිනිසාට අත්විඳීමට සිදුවන ප්‍රතිඵල 2ක් ලියන්න. (ල 5)

(7)

i. දකුණු ආසියානු කලාපයේ සාපේක්ෂ පිහිටීම ලියන්න. (ල. 4)

ii. a) පහත දැක්වෙන ජාතික කොඩි අයත් දකුණු ආසියාතික රටවල් දෙක A හා B පිළිවෙලින් ලියන්න.


A


B

b) දකුණු ආසියාතික රටවල් එක් වී පිහිටුවාගෙන ඇති සංවිධානයේ නම කුමක්ද?

c) එම සංවිධානයේ සාමාජිකත්වය දරණ මධ්‍යම ආසියාතික රටක් නම් කරන්න (ල. 4)

iii. දකුණු ආසියානු කලාපය සුවිශේෂී භූගෝලීය කලාපයක් වීමට බලපා ඇති හේතු 3 ක් ලියන්න. (ල. 3)

(8)

i. පහත දැක්වෙන කඳුවැටි පිහිටි රටවල් පිළිවෙලින් ලියන්න. (ල. 2)

a) පුලෙයිමාන් වැටිය b. හිමාල වැටිය

ii. කඳුකර භූ දර්ශනය තුළ දක්නට ලැබෙන භූ ලක්ෂණ 4 ක් ලියන්න (ල. 2)

iii. a) හිමාල කඳුකරයේ වාසය කරන ගෝත්‍රික ජන වර්ග 2ක් ලියන්න. (ල. 2)

b) කඳුකර භූ දර්ශනයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත රැකියා දෙකක් ලියන්න. (ල. 2)

c) කඳුකර භූ දර්ශනයට හැඩගැසුනු මානවයින්ගේ විශේෂිත ශාරීරික ලක්ෂණ තුනක් ලියන්න. (ල. 3)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 - 2024

## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

නම / විභාග අංකයඃ

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. 3 | 06. ✓ | 11. තාරකා | 16. ගැලීලියෝ ගැලිලි |
| 02. 2 | 07. ✓ | 12. 173 | 17. කැල්ටෙක් |
| 03. 4 | 08. ✗ | 13. සෙනසුරු | 18. ජල චක්‍රය |
| 04. 3 | 09. ✓ | 14. මාලදිවයින | 19. $38^0$ |
| 05. 3 | 10. ✗ | 15. නේපාලය | 20. ගුරුත්වාකර්ෂණ |

### II කොටස

(1) අ) i. ගංගානම් ගඟ
ii. සුන්දරබාන්
iii. කත්මන්ඩු
iv. පෝක් සමුද්‍ර සන්ධිය
v. ඉන්දියාව
vi. තාර් කාන්තාරය
vii. අන්දමන් දූපත්, නිකොබාර් දූපත්

ආ) A. නීල් ආම්ස්ට්‍රෝන් සඳ මත පා තැබීම
B. ග්‍රාහක කැබැල්ලක්
C. ගැලීලියෝ ගැලීලිගේ දුර දක්නය
D. සෙනසුරු ග්‍රහයා

ඉ) a. බ්‍රහස්පති b. නෙප්චූන් c. සිකුරු d. පෘථිවිය

(2) i. සූර්යයා හා ග්‍රාහක වළල්ල අතර පිහිටි ග්‍රහලෝක අභ්‍යන්තර ග්‍රහලෝක වේ
ii. a. පෘථිවිය
b. පාෂාණමය සංයුතියකින් යුක්ත වේ.
iii. a. ප්ලූටෝ, එරිස්, මාකේ මාකේ, හෝමියා
b. නිශ්චිත කක්ෂතලයක් නොමැති වීම
ග්‍රහලෝක වලට වඩා ප්‍රමාණයෙන් කුඩා වීම

(3) i. දේශාංශ යනු උත්තර ධ්‍රැවය සහ දක්ෂිණ ධ්‍රැවය සම්බන්ධ කරමින් නිර්මාණය කර ඇති කල්පිත රේඛා ජාලයයි.
ii. a. ග්‍රිනිච් මධ්‍ය දේශාංශය
b. 1. ප. ව. 3.50 2. පෙ. ව. 7.30
iii. a. ආක්ටික් වෘත්තය b. කර්කටක නිවර්තනය
c. මකර නිවර්තනය d. ඇන්ටාර්ක්ටික් වෘත්තය

(4) i. පෘථිවිය සූර්යයා වටා ගමන් කිරීම පරිභ්‍රමණය ලෙස හැඳින්වේ. දින 365 යි. පැය 6 කි.
ii. අක්ෂාංශීය වශයෙන් දිවා හා රාත්‍රි කාලවල දින වෙනස් වීම
පෘථිවියේ ඉහළ අක්ෂාංශීය ප්‍රදේශවල ඍතු භේදය ඇති වීම

iii. a. A. සරත් සෘතුව B. ශීත සෘතුව

b. B. උෂ්ණත්වය අඩුය
රාත්‍රි කාලය දිගින් වැඩිය
ශාක පත්‍ර සම්පූර්ණයෙන්ම හැලී යයි
හිම පතනය සිදු වේ

(5) i. a. 78.9% b. ඔක්සිජන්
c. 0.93% d. කාබන්ඩයොක්සයිඩ්

ii. ජීවයේ පැවැත්මට අවශ්‍ය මූලිකම සාධකයයි
ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වය සඳහා උපකාරී වේ
ඉහළ වායුගෝලයේ ඇති ඕසෝන් ස්ථරය මගින් ජීවීන්ට අහිතකර කිරණ පෘථිවිය කරා ඒම පාලනය කරයි.
උල්කාපාත වායුගෝලය හා ගැටීමේදී දැවීයාම නිසා පෘථිවිය මතට වැටීම පාලනය කරයි
පෘථිවි තලය මත උෂ්ණත්වය පාලනය වීම.

iii. අහිතකර වායු වායුගෝලයට මුදා හැරීම ප්‍රධාන වේ
කාර්මාන්තශාලා වලින් පිට කරන දුම්
ඉන්ධන දහනය නිසා $CO_2$ පරිසරයට එකතු විම
වනාන්තර විනාශ කිරීම
න්‍යෂ්ටික අත්හදා බැලීම්
වමාරාකන සතුන් ඇති කිරීම

(6) i. a. ජලය b. අයිස් c. ජල වාෂ්ප

ii. පානය කිරීමට
එදිනෙදා වැඩ කටයුතු කර ගැනීමට
කෘෂි කාර්මික කටයුතු සඳහා
විවිධ කර්මාන්ත සඳහා
ප්‍රවාහන කටයුතු සඳහා
විදුලිබලය නිෂ්පාදනය කිරීමට
විනෝද කටයුතු සඳහා

iii. a. ජලයට අපද්‍රව්‍ය දැමීම
කර්මාන්තශාලාවල අපද්‍රව්‍ය එකතු කිරීම
කැලි කසල දැමීම
වනාන්තර විනාශ කිරීම
නැව් වලින් තෙල් කාන්දු වීම

(7) i. උතුරින් - හිමාල කඳුවැටිය
දකුණින් - ඉන්දියන් සාගරය
බටහිරින් - අරාබි මුහුද
නැගෙනහිරින් - බෙංගාල බොක්ක

ii. a. A - බංගලාදේශය
B - පාකිස්ථානය
b. දකුණු ආසියාතික සහයෝගිතා සංවිධානය
c. ඇෆ්ගනිස්ථානය

iii. ඉහළම උන්නතාංශය දක්වන එවරස්ට් කඳු මුදුන පිහිටා තිබීම හා සුන්දරබාන් වගුරුබිම පිහිටා තිබීම
අධික ශීතල ප්‍රදේශ (හිමාල) මෙන්ම අධික උණුසුම් ප්‍රදේශ (ථාර් කාන්තාර) ප්‍රදේශ පිහිටා තිබීම
ඝණ වනාන්තර මෙන්ම තෘණ භූමිද පිහිටා තිබීම

(8) i. a. පාකිස්ථානය b. ඉන්දියාව

ii. දුර්ග, සානු, කපොලු, ගැඹුරු ගංදොරු, තේරු, කඳු

iii. a. භූමිය, කසා, දරඩි, ලෙස්චා, ෂෙර්පා

b. කඳු නගින අයට මග පෙන්වීම
භාණ්ඩ අලෙවි කිරීම
බර උසුලගෙන යාම

c. කඳු නැගීමට හැකිවන ලෙස ශක්තිමත්ව පිහිටි පැතලි පුළුල් පතුල් සහිත පාද
බර ඉසිලීමට හැකි ලෙස ශක්තිමත් වූ බාහු
අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත් වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු